# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2463/49 – 2025 නොවැම්බර් මස 22 වැනි සෙනසුරාදා – 2025.11.22**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2024/48.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

කේ. ආර්. පී. ශ්‍රේරු මයා, අංක 33/1, මගලෙගොඩ පාර, බෙම්මුල්ල.

සහ

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, තැ. පෙ. 1768, ලෝක වෙළඳ මධ්‍යස්ථානය - බටහිර කුලුණ, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිළියන්දල, බුද්ධාලෝක පාර, අංක 40, ආචාර්ය කේ. ඒ. තිලකරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 නොවැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

1A – G 045803– 18 (2025/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/2024/48.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

කේ. ආර්. පී. ශ්‍රේරු මයා, අංක 33/1, මගලෙගොඩ පාර, බෙම්මුල්ල.

සහ

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, තැ. පෙ. 1768, ලෝක වෙළඳ මධ්‍යස්ථානය - බටහිර කුලුණ, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

“ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරක සේවයේ යෙදී සිටි කේ. ආර්. පී. ශ්‍රේරු මහතා විනය විරෝධි චෝදනාවක් යටතේ වැඩ තහනම් කර අනතුරුව පැවති විධිමත් විනය පරීක්ෂණය වසර 3 කට ආසන්න කාලයක් පවත්වා එහි නියෝගය මත ඔහු විශ්‍රාමයාමට නියමිත දිනට දින 2 කට ප්‍රථම හිඟ වැටුප් හා දීමනා නොමැතිව යළි සේවයෙහි පිහිටුවීම තුලින් ඔහුට අසාධාරණයක් සිදුවී තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.”

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 – 0175

---

මගේ අංකය: IR/COM/04/2024/56.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ජේ. එම්. උපාලි මහතා, සිරි නිවස, දඹවින්න, වැලිමඩ.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් සීදූව, ලියනගේමුල්ල, HPT ප්‍රධාන පාර, 31/1, නීතිඥ සී. ඒ. එච්. එම්. විජේරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 නොවැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2024/56.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ජේ. එම්. උපාලි මහතා, සිරි නිවස, දඹවින්න, වැලිමඩ.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවයේ නියුතුව සිටින ජේ. එම්. උපාලි මහතා හට පහත සඳහන් කරුණු මත යම් අසාධාරණයක් සිදුවී තිබේද එසේ සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න වේ."

(i) සේවයට බැඳුන දිනයේ සිට ස්ථිර පත්වීම ලබාදීම සඳහා වසර 08 කට ආසන්න කාලයක් ගතකිරීම.

(ii) පත්වීම ස්ථිර කර වැටුප් ගෙවීමේදී පත්වීම් ලිපියේ සඳහන් කර ඇති මූලික වැටුප නොගෙවා ඔහු දැරූ අනියම් කම්කරු තනතුරට අදාළ වැටුප අඛණ්ඩව ගෙවීම.

(iii) ඒ ආකාරයට වසර 11 ක් පමණ දීර්ඝ කාලයක් එම වැටුප ගෙවීම සිදුකර එක්වරම ගෙවූ වැටුප වැරදි බව ප්‍රකාශ කර මාසික වැටුපෙන් පෙර ගෙවූ වැටුපෙන් කොටසක් වාරික වශයෙන් අඩු කිරීම.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 – 0176

---

මගේ අංකය: IR/COM/03/2023/143.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එම්. යූ. සංජීව පීරිස් මහතා, අංක 186/ඒ, කුලමුල්ල, වයික්කාල.

සහ

ඩොල්ෆින් හොටෙල්ස් පී.එල්.සී., ක්ලබ් හොටෙල් ඩොල්ෆින්, දකුණු කම්මල, වයික්කාල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී

ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බත්තරමුල්ල, පැලවත්ත, සිංහපුර පාර, අංක 117, සිරි සිංගප්පුලි මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 නොවැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2023/143.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එම්. යූ. සංජීව පීරිස් මහතා, අංක 186/ඒ, කුලමුල්ල, වයික්කාල.

සහ

ඩොල්ෆින් හොටෙල්ස් පී.එල්.සී., ක්ලබ් හොටෙල් ඩොල්ෆින්, දකුණු කම්මල, වයික්කාල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

"ක්ලබ් හොටෙල් ඩොල්ෆින් ආයතනයේ අලෙවි විධායකවරයෙකු වශයෙන් සේවය කළ එම්. යූ. සංජීව පීරිස් මහතා හට ඔහු සිදු කරන අලෙවිය මත ආයතනයට ලබා දෙන ආදායම වෙනුවෙන් පත්වීම් ලිපිය මගින් ඔහුට ගෙවීමට එකඟ වී ඇති 10% කොමිස් මුදල නියමිත ආකාරයෙන් නොගෙවීම තුළින් ඔහුට අසාධාරණයක් සිදුවී තිබේද එසේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්නත් වේ."

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 – 0177

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.